FACTSHEET

PUBLIC TRUSTEE AND GUARDIAN

# අපගේ සේවා සම්බන්ධ තොරතුරු

## අපගේ සේවා සම්බන්ධ තොරතුරු

ඕස්ට්‍රේලියානු කැපිටල් ටෙරිටරිය (Australian Capital Territory (ACT)) සඳහාවූ මහා භාරකරු සහ භාරකරු ස්ථාපනය කරන ලද්දේ 1985 මහා භාරකාර පනත මගිනි (Public Trustee Act 1985).

මහා භාරකාරවරයාගේ කාර්යභාරය වන්නේ ACT ප්‍රජාව හට ආරක්ෂාකාරී, කාර්යක්ෂම, තරඟකාරී සහ හොඳින් රැකබලා ගන්නා භාරකාර, බුදල් පරිපාලන සහ අන්තිම කැමති පත්‍ර සේවා ලබාදීමවේ.

## මහා භාරකාරවරයාව තෝරාගත යුත්තේ ඇයි?

මහා භාරකරු සහ භාරකරු අන්තිම කැමතිපත්‍ර, ඇටර්නි බලපත්‍ර සහ බුදල් පරිපාලනය සම්බන්ධයෙන් විශේෂඥතාවය ලබා ඇති අතර ඔබට උපදෙස් ලබාදීමට නිසි ලෙස සුදුසුකම් ලබා ඇත.

මහා භාරකාරවරයාව පොල්මක්කරු ලෙස නම්කර ඇති අවස්ථාවල ඔහු අන්තිම කැමති පත්‍ර සාදයි. මෙම සේවාව සඳහා සුළු මුදලක් අය කරේ.

ඔබ මියයනතෙක් බුදල් පරිපාලන ගාස්තු ගෙවිය යුතු නැත. මහා භාරකරු සහ භාරකරු පොල්මක්කරුගේ කාරභාරය ඉටුකරන්නේ මෙම අවස්ථාවේදීය. ඔබගේ වත්කම් බෙදාහරින විට එහි මුළු වටිනාකමින් කුඩා ප්‍රතිශතයක් අයකර ගනී. අප විසින් අයකල හැකි උපරිම ගාස්තු අනුපාත නීතිය මගින් තදින් පාලනය කෙරේ. හවුල් අයිතිය ඇති වත්කම් සම්බන්ධයෙන් කොමිස් මුදල් අය නොකෙරේ.

## අන්තිම කැමති පත්‍ර

ඔබගේ මරණයෙන් පසුව ඔබගේ කැමැත්ත අනුව ඔබගේ වත්කම් බෙදා හැරීමට හොඳම ක්‍රමය වන්නේ අන්තිම කැමති පත්‍රයක් සකස් කිරීමවේ. වලංගු අන්තිම කැමති පත්‍රයක් තිබීම මගින් ඔබ මරණයට පත්වූ අවස්ථාවක ඔබගේ පවුලේ අය සහ මිතුරන් අපහසුතාවයට පත්වීම වළකයි.

ඔබට අන්තිම කැමති පත්‍රයක් නොමැතිව මරණයට පත්වූ අවස්ථාවක අධිකරණය මගින් ඔබගේ බුදලය පරිපාලනය කිරීමට යම් අයෙකු පත්කල හැකිය. ඔබ අන්තිම කැමති පත්‍රයක් සාදන්නේ නම්, ඔබගේ පොල්මක්කරු ඔබ තෝරා ගනී.

මහා භාරකරු සහ භාරකරු අන්තිම කැමති පත්‍ර සෑදීම සම්බන්ධයෙන් විශේෂඥතාවය ලබා ඇත. ඔබ මහා භාරකාරවරයා ඔබගේ පොල්මක්කරු වශයෙන් පත්කර ඇති විට ඔබගේ බුදලය පරිපාලනය කිරීම සහ ඔබගේ කැමැත්තට අනුව ඔබගේ වත්කම් බෙදා හැරීමේ වගකීම අපි භාර ගනිමු.

මහා භාරකරු සහ භාරකරු තෝරා ගැනීම මගින් ඔබගේ බුදලය කාර්යක්ෂමව, පක්ෂග්‍රාහී නොමැතිව සහ විගසින් පරිපාලනය කරන බවට වග බලා ගනී.



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au

අන්තිම කැමති පත්‍රය ඔබ ජීවිතයේ අත්සන් කරන වඩාත්ම වැදගත් ලියවිල්ල විය හැකි අතර එය විශේෂඥයෙකු විසින් සකස් කල යුතුය. මහා භාරකරු සහ භාරකරුගේ කාර්ය මණ්ඩලය තුල නීති, ගණකාධිකාරී, බදු සහ ආයෝජන වෘත්තිකයන් සිටී.

ඔබගේ දැනට පවතින අන්තිම කැමති පත්‍රය සමාලෝචනය කිරීම හෝ නව අන්තිම කැමති පත්‍රයක් සකස් කිරීම ඉතාම තරගකාරී මුදලකට කිරීමට මහා භාරකරු සහ භාරකරු හට හැකියාව ඇත.

## අන්තිම කැමති පත්‍රයක් තබා යම් අයෙකු මියගිය අවස්ථාවක

අන්තිම කැමති පත්‍රයක් තබා මියගිය පහත අවස්ථාවල මහා භාරකාරයා විසින් බූදලය පරිපාලනය කල හැකිවේ:

- අන්තිම කැමති පත්‍රයේ මහා භාරකරු සහ භාරකරු පොල්මක්කරු ලෙස නම්කර ඇති අවස්ථාවක;
- පොල්මක්කරු ක්‍රියා කිරීමට අකමැති අවස්ථාවක, පොල්මක්කරු ACT හි ජීවත් නොවන අවස්ථාවක හෝ මියගොස් ඇති අවස්ථාවක; හෝ/සහ
- නම්කරන ලද පොල්මක්කරු අධිකරණයක් මගින් ඉවත් කර ඇති අවස්ථාවක.

## අන්තිම කැමති පත්‍රයක් නොමැති අවස්ථාවක (තෙස්තමේන්තු රහිත)

යම් පුද්ගලයෙකු අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගිය අවස්ථාවක තෙස්තමේන්තු රහිතව මියගිය ලෙස සලකයි. එවන් අවස්ථාවක තෙස්තමේන්තු රහිත නීතිය යටතේ බූදලය පරිපාලනය කිරීම සහ බෙදා හැරීම සඳහා අධිකරණය මගින් පරිපාලකයෙකු පත්කල හැකිය. මෙම නීති එක් එක් ප්‍රාන්තය සහ ටෙරිටරිය අනුව වෙනස්විය හැකි අතර සෑම පවුල් අවස්ථාවක්ම ආවරණය කිරීම සඳහා නීති නොතිබිය හැකිය.

මෙවැනි අවස්ථාවක බූදලය පරිපාලනය කිරීමට අයිතිය ඇති අන්තිම කැමති පත්‍රයක් නොතබා මියගිය අයගේ පවුලේ සාමාජිකයෙකු විසින් බූදලය පරිපාලනය කිරීමට මහා භාරකරු සහ භාරකරුගෙන් ඉල්ලා සිටිය හැකිය.

මහා භාරකරු සහ භාරකරු ඔබගේ පරිපාලක වශයෙන්:

- අවශ්‍ය ආකාරයට බදු ගොනු කිරීම් (taxation returns) සහ ඔප්පු ලිවීම පිළියෙල කල හැකිය.
- පරිපාලනය කරන කාලය තුල තිබෙන අරමුදල් ආයෝජනය කර එම අරමුදල් සම්බන්ධයෙන් තරගකාරී පොළී අනුපාත ගෙවීම.
- බූදලය පරිපාලනය කරන අතරතුර සහ අවසානයේදී අර්ථලාභීන් හට වාර්තා කිරීම.

## බූදලය පරිපාලනය කිරීම

මෙය මහා භාරකරු සහ භාරකරුගේ ප්‍රධාන කාර්යභාරයක්වේ. අන්තිම කැමති පත්‍රයක් ඇතිවිට එහි ඇති කොන්දේසි අනුව හෝ අන්තිම කැමති පත්‍රයක් නොමැති විට තෙස්තමේන්තු රහිත නීතිය යටතේ බූදල් පරිපාලනය කල හැකිවේ.

## භාර පරිපාලනය



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au

භාර (Trusts) ඇති කිරීම හේතු ගණනාවක් මත සිදු කල හැකිය. මේවා අතර ඔබගේ අන්තිම කැමති පත්‍රය යටතේ අර්ථලාභියෙකුට දිගින් දිගටම ප්‍රතිලාභ ලබාදීම, බදු සම්බන්ධයෙන් කාර්‍යක්‍ෂමව බුදල් සැලසුම් කිරීම හෝ පුණ්‍ය ආයතනයකට ප්‍රතිලාභ ලබාදීම තිබිය හැක. භාරයක් මගින් ඔබගේ වත්කම් සුරක්ෂිත කර පසු කාලීනව ඔබගේ දරුවන් සහ යැපෙන්නන් හට ප්‍රතිලාභ ලබා දිය හැකිය.

උදාහරණ වශයෙන් ඔබගේ බුදලයෙන් කොටසක් නියමිත කාලයකට භාරයක් වශයෙන් තැබිය හැකිය. මේ මගින් ඔබගේ දරුවන් වයස අවුරුදු 18 වන තෙක් හෝ ඔවුන්ගේ අධ්‍යාපනය අවසන් කරන තෙක් ඔවුන්ගේ අධ්‍යාපන සහ වෙනත් අවශ්‍යතා සුරක්ෂිත කර දිය හැකිය. ඕනෑම දේපළක භාරකරු වශයෙන් අන්තිම කැමති පත්‍රයක් මගින් හෝ ඔප්පුවක් මගින් හෝ අධිකරණයක් මගින් මහා භාරකරු සහ භාරකරුව පත්කල හැකිවේ. භාරකරුවෙකු මියගිය අවස්ථාවක හෝ විශ්‍රාම ගිය අවස්ථාවක මහා භාරකරු සහ භාරකරුව නව භාරකරු වශයෙන් පත්කල හැකිවේ.

භාරයක දිගු කාලීන ස්වරූපය හේතුවෙන් භාරයක් ස්ථාපනය කිරීමේදී පළපුරුද්ද සලකා බැලීම වැදගත්වේ.

## ආබාධිත අය සහ ළමුන් සඳහා භාරකරුවන්

මූල්‍ය වන්දි ලබාදුන් අය සහ යම් පුද්ගලයෙකු වෙනුවෙන් අරමුදල් පරිපාලනය කරන ලෙස අධිකරණයක් මගින් විධානය කල ඇති අවස්ථාවල මහා භාරකර, භාරකරුවෙකු වශයෙන් කටයුතු කරනු ඇත. සාමානයෙන් දරුවා වයස 18 වන තෙක් අරමුදල් කළමණාකරණය කෙරේ.

## චිරස්ථායී ඇටර්නි බලකරු

හදිසි අනතුරු, හදිසි අසනීප හෝ අනපේක්ෂිත ලෙස අතුරුදහන්වූ විට ඔබගේ මූල්‍ය කටයුතු කළමණාකරණය කිරීමට යම් අයෙකු අවශ්‍ය විය හැකිය.

ඔබගේ ස්වාධීන සහ වගකීමෙන් බැදී සිටින ඇටර්නි බලකරු ලෙස කටයුතු කිරීමට මහා භාරකරු සහ භාරකරු සතුව අවශ්‍ය පළපුරුද්ද ඇත. ඔබගේ වගකීම් ඉටු කිරීමට සහ මූල්‍ය කටයුතු කළමණාකරණය කිරීමට ඔබට නොහැකි අවස්ථාවල  ඒවා කිරීමට ඔබට උපකාර කිරීමට අපට හැකිවේ.

ඔබගේ ඇටර්නි බලකරු වශයෙන් ඔබ විසින් පත් කරන අය ඔබගේ උපදෙස් පරිදි ඔබගේ වත්කම් සහ මූල්‍ය කටයුතු කළමණාකරණය කරනු ඇත. මෙය ඔබ අසනීපවුණු අවස්ථාවක හෝ වෙන හේතුවක් නිසා ඔබගේ කටයුතු කර ගැනීමට නොහැකිවූ අවස්ථාවක වුවද දිගටම සිදුවේ. ඔබගේ කටයුතු කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් ඔබගේ ඇටර්නි බලකරු වෙනත් කිසිම අයෙකුට වාර්තා කිරීමට කිසිදු නෛතික බැඳීමකට යටත් නොවේ.

## පුද්ගලික මූල්‍ය කළමණාකරණය

හදිසි අනතුරු, අසනීප හෝ ආබාධ හේතුවෙන් සිය කටයුතු කළමණාකරණය කරගත නොහැකි අය සම්බන්ධයෙන් මහා භාරකරු සහ භාරකරු විශේෂ වගකීමක් භාරගනී.

දැනටමත් චිරස්ථායී ඇටර්නි බලකරුවෙකු නොමැති එවැනි අයෙකුගේ අයිතිවාසිකම් නියෝජනය කිරීමට කළමණාකරණ නියෝගයක් (Management Order) මගින් ACT සිවිල් සහ පරිපාලන පර්ෂදය (ACT Civil and Administrative Tribunal (ACAT)) මගින් මහා භාරකරු සහ භාරකරු පත්කල හැකිය.



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au

මහා භාරකරු සහ භාරකරු විසින් අදාල පුද්ගලයාගේ මූල්‍ය කටයුතු කළමණාකරණය කරන අතර අවශ්‍ය අවස්ථාවල සියළුම තිබෙන අරමුදල් සහ සම්පත් මගින් සේවාදායකයාගේ සුබසිද්ධිය සහ ජීවන රටාව වැඩි දියුණු කරන බවට සහතික කිරීම සඳහා පවුලේ අය, අදාල කටයුත්ත සම්බන්ධයෙන් ක්‍රියා කරන සේවකයා සහ සේවාදායකයාගේ අදහස් විමසනු ඇත.  (“ඔබට ඔබගේ කටයුතු කළමණාකරණය කරගත නොහැකි අවස්ථාවල” (“When you are Unable to Manage Your Affairs”) පොත් පිංචද බලන්න).



Ground Floor
221 London Circuit
Canberra City ACT 2601

PO Box 221
Civic Square ACT 2608

Tel (02) 6207 9800
Fax (02) 6207 9811

Email ptg@act.gov.au
Web www.ptg.act.gov.au